# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 33 දරන
# විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 සැප්තැම්බර් මස 15 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1988 සැප්තැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 30 යි.

තැපැල් ගාස්තුව : ශත 75 යි.

1988 අංක 33 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 සැප්තැම්බර් මස 15 වන දින]

එල්. ඩී.—ඕ 55/88

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 33 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 70අ වගන්තිය, එහි අගට මෙහි පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1978 අංක 16 දරන පනතේ 70අ වගන්තිය සංශෝධනය කිරීම.

" (3) උපාධි ප්‍රදාන ආයතනයකට, ඒ උපාධි ප්‍රදාන ආයතනයේ (විධානයේ දිනට පෙර ඇතුළත් කර ගනු ලැබුව ද පසුව ඇතුළත් කරනු ලැබුව ද) සෑම ශිෂ්‍යයකුම, ඒ උපාධි ප්‍රදාන ආයතනය පිළිගනිමින් 25අ වගන්තිය යටතේ කරන ලද නියමයේ නිශ්චය කොට දැක්වෙන, අධ්‍යයන ක්ෂේත්‍රවල ඒ උපාධි ප්‍රදාන ආයතනය විසින් මෙහෙයවා පවත්වනු ලබන විභාගවලට පමණක් පෙනී සිටීමට සුදුසු විය යුතු බවට අමාත්‍යවරයා විසින් විශේෂ විධානයක් නිකුත් කළ හැකි ය.

(4) උපාධි ප්‍රදාන ආයතනයකට (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන විශේෂ විධානයක් ඒ සුදුසුවීම පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් අවසානාත්මක හා තීරණාත්මක වන අතර කිසිම අධිකරණයක දී එය ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ උපාධි ප්‍රදාන ආයතනයකට නිකුත් කරන ලද විශේෂ විධානයක්—

(අ) ඒ උපාධි ප්‍රදාන ආයතනය හෝ එහි පාලනාධිකාරය සහ ඒ උපාධි ප්‍රදාන ආයතනයේ ශිෂ්‍යයන් අතර;

(ආ) ඒ උපාධි ප්‍රදාන ආයතනය හෝ එහි පාලනාධිකාරය සහ යම් උසස් අධ්‍යාපන ආයතනයක් අතර; හෝ

(ඇ) ඒ උපාධි ප්‍රදාන ආයතනයේ ශිෂ්‍යයන් සහ යම් උසස් අධ්‍යාපන ආයතනයක් අතර

ඇතිකර ගන්නා ලද යම් ගිවිසුමක හෝ යම් නඩුවක දී ඇතිකර ගන්නා ලද යම් සමථයක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද බලාත්මක විය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.